ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2006 අංක 54 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2006 දෙසැම්බර් මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 දෙසැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 4.25 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2006 අංක 54 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 දෙසැම්බර් මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 70/2006.

## 1990 අංක 19 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2006 අංක 54 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1990 අංක 19 දරන පනතට 5අ. 5ආ. 5ඇ සහ 5ඈ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

2. 1990 අංක 19 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති එකී පනතේ 5අ, 5ආ, 5ඇ සහ 5ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

දිසා අධිකරණවලින් සහ පවුල් අධිකරණවලින් පැමිණෙන අභියාචන විභාග කිරීමේ අධිකරණ බලය.

5අ. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයක් විසින්, එකී පළාත ඇතුළත වූ යම් දිසා අධිකරණයක් හෝ පවුල් අධිකරණයක් විසින් නිකුත් කරන ලද හෝ ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ සහ ආඥා සම්බන්ධයෙන් අභියාචන සහ ප්‍රතිශෝධන අධිකරණ බලය සහ අවස්ථාවෝචිත පරිදි, එවැනි යම් දිසා අධිකරණයක් හෝ පවුල් අධිකරණයක් විසින් සිද්ධි පිළිබඳව හෝ නීතිය පිළිබඳව හෝ සිදු කරන ලද සියලු වැරදි නිවැරදි කිරීම සඳහා වූ අභියාචන අධිකරණ බලය, ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) අභියාචනාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු (1) වන උපවගන්තියේ සඳහන් අධිකරණ බලය සම්බන්ධයෙන් අදාළ වන්නා වූ, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 23 වන වගන්තියේ සිට 27 වන වගන්ති දක්වා වූ වගන්තිවල සහ (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 753 වන වගන්තියේ සිට 760 වන වගන්තිය දක්වා වූ වගන්තිවල

2-P.L. 001613- 4,500 (2006/11)

සහ 765 වන වගන්තියේ සිට 777 වන වගන්තිය දක්වා වූ වගන්තිවල සහ වෙනත් යම් ලිඛිත නීතිවල විධිවිධාන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයක් සඳහා ද කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, යම් පළාතක් ඇතුළත වූ යම් දිසා අධිකරණයක හෝ පවුල් අධිකරණයක නඩු තීන්දුවකින්, තීන්දු ප්‍රකාශයකින් හෝ ආඥාවකින් අතෘප්තියට පත් වන යම් තැනැත්තකු විසින්, එකී පළාත සඳහා පිහිටුවන ලද මහාධිකරණයෙන් එකී උපවගන්තියේ සඳහන් අධිකරණ බලය ක්‍රියාත්මක කරවා ගැනීම කළ හැකි ය:

එසේ වුවද, අවස්ථාවෝචිත පරිදි, දිසා අධිකරණයක, හෝ පවුල් අධිකරණයක කිසිදු නඩු තීන්දුවකින් හෝ තීන්දු ප්‍රකාශයකින්, පාර්ශ්වකරුවන්ගේ වැදගත් අයිතිවාසිකම්වලට හානියක් සිදු වී නොමැති හෝ යුක්තිය ඉටු නොවීමක් සිදු වී නොමැති අවස්ථාවක, කිසියම් වරදක්, දෝෂයක්, හෝ අක්‍රමිකතාවක් හේතුකොටගෙන මහාධිකරණය විසින් එවැනි නඩු තීන්දුවක් හෝ තීන්දු ප්‍රකාශයක් ප්‍රතිවර්තනය කිරීම හෝ වෙනස් කිරීම නොකළ යුතු ය.

අභියාචන විභාග කිරීම.

5ආ. 5අ වගන්තියේ සඳහන් කරන ලද පළාත්බද මහාධිකරණයක අධිකරණ බලය, ඒ අධිකරණයේ විනිසුරුවරුන් දෙදෙනකුට නොඅඩු ගණනක් මගින්, එක්ව විභාග කිරීමෙන්, සියලු අවස්ථාවන් හි දී සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

මහාධිකරණයේ නිරණයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචන ඉදිරිපත් කිරීම.

5ඇ. (1) 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයක් විසින්, මෙම පනතේ 5අ වගන්තිය මගින් ප්‍රදානය කරන ලද අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රකාශයට පත් කළ හෝ එලඹුන කිසියම් නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් පිළිබඳ වූ

අභියාචනයක්, ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසරය ලබා ගැනීමෙන් අනතුරුව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත සෘජුව ම ඉදිරිපත් කරනු ලැබිය හැක්කේ ය. එසේ අවසරය ඉල්ලා සිටීමේ දී, අදාළ කාරණය නීතිය පිළිබඳ වැදගත් ප්‍රශ්නයක් හෝ ඒ අධිකරණය විසින් සමාලෝචනය කිරීම සඳහා සුදුසු කාරණයක් යැයි ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය වන අවස්ථාවක දී, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ ඉල්ලා සිටින ලද අවසරය ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද කිසියම් අභියාචනයක් සම්බන්ධයෙන්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 127 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව මගින් එයට ප්‍රදානය කරන ලද බලතල සියල්ල හෝ ඉන් කිසිවක්, ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

*අභියාචනාධිකරණයෙන් පළාත්බද මහාධිකරණයට නඩු කටයුතු මාරුකිරීම.*

5ඇ. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණයකට මේ පනතේ 5අ වගන්තියෙන් ප්‍රදානය කරන ලද අධිකරණ බලය සම්බන්ධයෙන් වූ කිසියම් අභියාචනයක් හෝ ඉල්ලීමක් අභියාචනාධිකරණයේ ගොනු කරනු ලබන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඒ අභියාචනය හෝ ඉල්ලීම විමසා තීන්දුදීම පිණිස අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි සුදුසු මහාධිකරණයක් වෙත, පවරනු ලැබිය හැකි ය. අවස්ථාවෝචිත පරිදි, එසේ යොමු කරන ලද අභියාචනයක් හෝ ඉල්ලීමක්, ඒ අභියාචනය හෝ ඉල්ලීම ඒ මහාධිකරණය වෙත සෘජුවම යොමු කරනු ලැබූ යම් අභියාචනයක් හෝ ඉල්ලීමක් ලෙසින්ම සලකා, මහාධිකරණය විසින් විභාගකොට තීන්දු දිය යුතු ය.

(2) අගවිනිසුරුවරයා විමසා අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින්, මේ වගන්තිය ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ දී විභාග වෙමින් පවතින අභියාචන,

ප්‍රතිශෝධන ඉල්ලීම් සහ යථා තත්ත්වයට පැමිණවීම් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පිහිටුවන ලද උචිත මහාධිකරණයක් විසින් විභාග කොට තීන්දු කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස, කලින් කල විධාන කරනු ලැබිය හැකි ය. එවැනි විධානයක්, අවස්ථාවෝචිත පරිදි, එකී අභියාචනය හෝ ඉල්ලීම අභියාචනාධිකරණයේ ගොනු කරනු ලැබූ වර්ෂයට අදාළව කරනු ලැබිය යුතු අතර, එකී අභියාචනය හෝ ඉල්ලීම සෘජුව ම මහාධිකරණයේ ගොනු කරනු ලැබූ ලෙස සලකා මේ පනතේ 5අ වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, අවස්ථාවෝචිත පරිදි, එම අභියාචනය හෝ ඉල්ලීම විභාග කොට තීන්දු කිරීමට එකී මහාධිකරණය වෙත අධිකරණ බලය සතු විය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3**. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32. ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.